# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1958/27 - 2016 මාර්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :-4639
විශේෂ්‍ය අංකය :- කො/1807
කො/1808

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ අංක 21 නෝර්ටන් ලොජ් හි විසූ දිවංගත ආචාර්ය ගාමිණී කොරෙයා මහතා විසින් පනතේ 18 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කර තිබූ බැවින් පනතේ 19 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් අංක 291/18 හා 1977.11.16 වැනි දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ව්‍යවස්ථාපිත නිශ්චය අංක 3244 යටතේ ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී.

එසේම කො/1807 ව්‍යවස්ථාපිත ප්‍රකාශක දිවංගත ආචාර්ය ගාමිණී කොරෙයා මහතාගේ මෑණියන් වන ඉහත කී ලිපිනයෙහිම පදිංචිව සිටි කො/1808 ව්‍යවස්ථාපිත ප්‍රකාශිකාව වන දිවංගත ඇලිස් ප්‍රීඩා කොරෙයා මහත්මිය විසින් ද ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් ඉදිරිපත් කර තිබූ අතර ඇය වෙනුවෙන් ද අංක 21/4 හා 1979.01.29 වැනි දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ව්‍යවස්ථාපිත නිශ්චය අංක 3533 යටතේ ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ වුවද එකී කො/1808 ව්‍යවස්ථාපිත ප්‍රකාශිකාව වූ ඇලිස් ප්‍රීඩා කොරෙයා මහත්මිය වර්ෂ 1978.10.19 වැනි දින හෝ ඊට ආසන්න දිනයක මිය යන ලද බැවින් ඇගේ අයිතියෙහි එකම නීත්‍යානුකූල උරුමකරු වශයෙන් දිවංගත ආචාර්ය ගාමිණී කොරෙයා මහතා නැවත උපරිමයට වැඩි ඉඩම් හිමියෙකු බවට පත් විය.

එබැවින් 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) සහ 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත් මගින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව දිවංගත ආචාර්ය ගාමිණී කොරෙයා මහතාට උපරිමය ඉක්මවා උරුම වූ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුවේ.

එසේ හෙයින් එකී කො/1807 ව්‍යවස්ථාපිත ප්‍රකාශක දිවංගත ආචාර්ය ගාමිණී කොරෙයා මහතාගේ බූදලයට හිමි නව ව්‍යවස්ථාපිත නිශ්චය වෙන්කර මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇත.


1A - G 23143 — 18 (2016/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේම දැනටමත් එකී කො/1807 ව්‍යවස්ථාපිත ප්‍රකාශක ආචාර්ය ගාමිණි කොරෙයා මහතා නමින් ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 291/18 හා 1977.11.16 වැනි දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ව්‍යවස්ථාපිත නිශ්චය අංක 3244 යටතේ ප්‍රසිද්ධියට පත් කරන ලද ව්‍යවස්ථාපිත නිශ්චය මෙයින් අවලංගු කරනු ලැබේ.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 මාර්තු මස 15 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

උපලේඛනය

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 553, ලිහිණිවැහැර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ලිහිණිවැහැර ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද කැඩැස්තර සිතියම් අංක 420151 කලාප අංක 02 හි හොලොන්ගොල්ල වත්ත නැමැති කුඹුරු ඉඩමේ අක්. 01 රූඩ්. 01 පර්. 16.9 ක ප්‍රමාණය ඇති කැබලි අංක 1 දරන බිම් කැබැල්ල ද.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 553, ලිහිණිවැහැර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ලිහිණිවැහැර ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද කැඩැස්තර සිතියම් අංක 420151 කලාප අංක 02 හි කොලොන්ගොල්ල වත්ත නැමැති ඉඩමේ අක්. 48 රූඩ් 03. පර්. 33.1 ක ප්‍රමාණය ඇති කැබලි අංක 159 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද වේ.

04 - 278

---

## නිවැරදි කිරීමයි

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

අංක 1956/8 හා 2016.02.29 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ඉහත මාතෘකාව යටතේ පළ කරන ලද නිවේදනයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ නම ''ටී. එච්. සුමනතිස්ස තාඹුගල'' යනුවෙන් පළ වී ඇති අතර, එය ''ටී. ඒ. සුමනතිස්ස තාඹුගල'' යනුවෙන් නිවැරදි විය යුතු ය.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 මාර්තු මස 16 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

04 - 398

## නිවැරදි කිරීමයි

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

අංක 1957/17 හා 2016.03.09 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි උක්ත මැය යටතේ, ව්‍යවස්ථාපිත නිශ්චය අංක 2515 ට අදාළ දැන්වීමෙහි හතරවැනි පේළියෙහි පළවී ඇති, ''අංක 227/5 හා 1971.08.25 වැනි දිනැති'' යන්න, ''අංක 227/5 හා 1976.08.25 වැනි දිනැති'' යනුවෙන් ද, ව්‍යවස්ථාපිත නිශ්චය අංක 4637 ට අදාළ දැන්වීමෙහි උපලේඛනයේ තුන්වැනි පේළියෙහි පළවී ඇති, ''කැතිගාවතැන්න වත්ත නැමති ඉඩමේ කැබැලි අක්. 16, රූඩ් 0, පර්. 17.12'' යන්න, ''කැතිගාවතැන්න වත්ත නැමැති ඉඩමේ අක්. 16, රූඩ් 0, පර්. 17.12'' යනුවෙන් ද නිවැරදි විය යුතු ය.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 මාර්තු මස 17 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

04 - 578

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.